


### තෙත් කලාපයේ වී අස්වනු වැඩිකරන

# Bw වී ප්‍රභේද

අද වනවිට අප රට සහලින් ස්වයංපෝෂිත වී ඇත. වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද හඳුන්වාදීමත් එම වී ප්‍රභේද ගොවි ජනතාව අතර ප්‍රචලිත වීමත් යන කරුණු මෙරට සහලින් ස්වයංපෝෂිත වීම සඳහා ඉමහත් ලෙස දායක වී ඇත. වියළි සහ අතරමැදි කලාප රටේ වී නිෂ්පාදනය සඳහා වැඩි දායකත්වයක් ලබාදුන්නද, තෙත් කලාපයේ වී වගාවේ අස්වනු වැඩි කර ගැනීම ද ඉතාමත් වැදගත් වේ. මන්දයත්, අහිතකර කාලගුණ තත්ත්ව වලදී වියළි හා අතරමැදි කලාපවල වී වගාවේ අස්වැන්න දැඩි ලෙස බලපෑම්වලට ලක්වුවහොත්, රටේ සහල් අවශ්‍යතාවය සපුරාගැනීමට තෙත් කලාපයේ වී අස්වැන්න උපකාරී වීමයි. එනම් තෙත් කලාපයේ වී වගාව ස්වාරක්ෂක කලාපයක් ලෙස ක්‍රියා කරයි.

තෙත් කලාපයේ කුඹුරුවල පාංශු ලක්ෂණ, කුඹුරු යායන් අතර සහ යාය තුළත් විශාල වශයෙන් විවිධත්වයක් පෙන්වන අතර එම පාංශු තත්ත්වයන්ට ගැලපෙන ලෙස වී ප්‍රභේද සහ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම භාවිතය යන කරුණු වී අස්වනු වැඩිකර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේදයන් වේ. තෙත් කාලාපයේ පස, ප්‍රධාන වශයෙන්

ඛණිජමය හා කාබනික ලෙස කොටස් 2 කට වර්ග කළ හැකිය. සාමාන්‍යයෙන් කුඹුරු යායේ පහළ කොටස් කාබනික වන අතර ඉහළ කොටස ඛණිජමය ලෙස වේ. අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අනුව කාබනික පස, හැල් සහ අර්ධ හැල් ලෙස නැවත වර්ග කළ හැකිය. හැල් කුඹුරු වල පාංශු ගැඹුර මීටර් 3 ක් පමණ වේ. කුඹුරු යායේ ඉහළ කොටසේ පිහිටි ඛණිජමය පස වර්ෂාවට සේදී යාම නිසා පසෙහි වයනය වැලිමය ස්වභාවයක් ගනී. තවද අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය, පාංශු පෝෂකත්වය සහ pH අගය ඉතා අඩු මට්ටමක පවතී. එම නිසා යායේ ඉහලින් ඇති වැලිමය වයනක් සහිත පසෙහි වී නිෂ්පාදන විභවය ඉතාමත් අඩුය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වී අභිජනනය සඳහා වගකීම් දරණ ප්‍රධාන ආයතනය වනුයේ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයයි. ඒ යටතේ පවතින බෝඹුවල වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධාන වගකීම වනුයේ පහතරට තෙත් කලාපයේ අහිතකර පාංශු ලක්ෂණ සඳහා සුදුසු වී ප්‍රභේද අභිජනනය කිරීම තුලින් කලාපයේ වී අස්වනු වැඩි කිරීමයි. 2014 වසර දක්වා බෝඹුවල වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය අභිජනනය කර නිදහස් කරන ලද ප්‍රභේද ගණන 15 කි. මෙම වී ප්‍රභේද, කලාපය තුළ පවතින විවිධ පාංශු කාණ්ඩ වලදී ඒකාකාරී ලෙස අස්වනු ලබා නොදෙන බැවින් විවිධ පාංශු තත්ත්වයන්ට වඩාත්ම සුදුසු වී ප්‍රභේද තෝරා ගැනීම කලාපයේ වී අස්වනු ඉහළ නැංවීම සඳහා වඩාත් උපකාරී වේ.

විවිධ පාංශු කාණ්ඩ සඳහා වඩාත් සුදුසු වී ප්‍රභේද අධ්‍යයනය සඳහා පර්යේෂණ 2014 සිට 2015 වසර දක්වා සිදු කරන ලදී. එම පර්යේෂණ සඳහා වයනය සහ අඩංගු කාබනික ප්‍රමාණයේ විවිධත්වය මත අර්ධ හැල්, ඛණිජමය සහ වැලිමය ලෙස ක්ෂේත්‍ර තෝරා ගන්නා ලදී. එම ක්ෂේත්‍ර 3 හි ගොවින් අතර දැනට ජනප්‍රිය Bw වී ප්‍රභේද 06 ක් (Bw 372, Bw 367, Bw 363, Bw 361, Bw 267-3 හා Bw 272-6b) සහ Bg 300 යන ප්‍රභේද අත්හදා බලන ලදී.

පර්යේෂණ දත්තයන්ට අනුව තෝරා ගන්නා ලද කාණ්ඩ 3 හි සාමාන්‍ය අස්වනු වල වෙනසක් දැකිය හැකි අතර අර්ධ හැල් කුඹුරු වල හෙක්ටයාරයකට ටොන් 3.98ද



බණිජමය කුඹුරු වල හෙක්ටයාරයකට ටොන් 2.80 සහ වැලිමය කුඹුරු වල හෙක්ටයාරයකට ටොන් 1.65 අස්වැන්නක්ද ලබා දුනි. මෙහිදී අර්ධ හැල් කුඹුරු වල අඩංගු කාබනික ද්‍රව්‍ය 17% - 19% පැවැති අතර වැලිමය කුඹුරු වල අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය 4 - 5% දක්වා විය. මේ අනුව කාබනික ද්‍රව්‍ය වැඩි හැල් කුඹුරු වල නිෂ්පාදන විභවය වැලිමය පස් සහිත කුඹුරු වලට වඩා වැඩි බව පැහැදිලිව නිරීක්ෂණය විය.

එසේම එක් එක් පාංශු වර්ග වලදී අත්හදා බලන ලද වී ප්‍රභේද වල අස්වැන්න එකිනෙකට වෙනස් විය. අර්ධ හැල් ක්ෂේත්‍ර තුළ Bw 367, Bw 372, Bw 267-3 සහ Bw 361 යන ප්‍රභේද අනෙකුත් ප්‍රභේද වලට සාපේක්ෂව ඉහළ අස්වැන්නක් ලබා දෙන ලදී. වැලිමය වයනයක් සහිත ක්ෂේත්‍ර වල ඉහළ අස්වනු ලබා දුන් අතර බණිජමය පසෙහි සියළුම Bw ප්‍රභේද ඒකාකාරී ලෙස අස්වනු ලබා දුනි. කෙසේ වුවද පාංශු කාණ්ඩ 3 හිම Bg 300 ප්‍රභේදය, අත්හදා බලන ලද Bw ප්‍රභේද වලට සාපේක්ෂව අඩු අස්වැන්නක් ලබා දෙන ලදී. කළුතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය කෘෂිකර්ම කර්යාලයේ දත්ත වලට අනුව 2014/2015 මහ කන්නයේ වගා කරන ලද මුළු වී ප්‍රමාණයෙන් 53% පමණ Bg ප්‍රභේද වගා කර ඇති අතර Bw ප්‍රභේද වගා කර ඇත්තේ 27.1% කි. කළුතර දිස්ත්‍රික්කය තුළ ජනප්‍රිය Bg ප්‍රභේද වනුයේ Bg 300, Bg 359 සහ Bg 358 වන අතර එම වර්ග වගා කර ඇති ප්‍රමාණ පිළිවෙලින් 21.6%, 19.6%, 10.7% කි. අප අත්හදා බලන ලද Bw ප්‍රභේද වලට සාපේක්ෂව Bg 300 සියළුම පාංශු කාණ්ඩ වලදී අඩු අස්වැන්නක් ලබා දුන් බැවින් දිස්ත්‍රික්කය තුළ වගා කරන Bw වී ප්‍රභේද වගා වපසරිය වැඩි කිරීම පහත රට තෙත් කලාපය තුළ වී අස්වනු වැඩි කර ගැනීමට උපකාරී වේ.

මේ අනුව වැඩි අස්වැන්නක් ලබා ගැනිම සඳහා Bw 367, Bw 372, Bw 267-3 සහ Bw 361 යන ප්‍රභේද හැල් කුඹුරු සඳහා ද, Bw 372, Bw 361 සහ Bw 363 යන වී ප්‍රභේද වැලිමය කුඹුරු සඳහා ද වඩාත් යෝග්‍ය බව මෙම පර්යේෂණ තුලින් පැහැදිලි විය.

**පර්යේෂණ පත්‍රිකාව ගොවිකම් සඟරාවට ගෙන ආවේ,**

කේ. වී. වික්‍රමසිංහ, එස්. පී. ගුණරත්න,
ඩී. එම්. ජයසුන්දර, එච්. ඒ. අයි. සජීවනී,
කේ. ඩී. එස්. සඳමාලි, ජේ. බී. කන්නන්ගර

**ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල**

